පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය - 2020

-----------------------------------------------------------

පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 ඔක්තෝබර් 23 දින එළඹි මූල්‍ය ගිවිසුම් අංක 5678 සී (3) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා අමාත්‍යාංශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන ප්‍රාථමික අධ්‍යාපන, පාසල් අතර වැඩිලි වගාව සංවර්ධන භාරය හරහා ක්‍රියාත්මකව දියත් කෙරේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, පූර්ව ළමාවිය සංවර්ධන සේවාවන්හි ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සාධාරණ ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි. මුල් ළමාවිය සංවර්ධන සේවා සැපයීම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය, අධීක්ෂණය සහ ඇගයීම යන ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කොටස් 02 ක් යටතේ ක්‍රියාවට නංවා ඇත. මූල්‍ය ගිවිසුම අනුව රු. මිලියන 7,250 කට සමාන එ.ජ.ඩො. මිලියන 50 ක් වූ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 පෙබරවාරි 16 දින ආරම්භ කරන ලද අතර, 2021 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3** මතය

-----

2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සත්‍ය හා සාධාරණ තත්ත්වය දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මාගේ මතය වේ.

**1.4** මතය සඳහා පදනම

------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපාතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධිත පාර්ශව විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුලුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිදුවීම් සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමක් ළඟාකර ගන්නේ යන්න ඇගයීම.

මාගේ විගණනයේදී හඳුනාගත් සැලකිය යුතු විගණන නිරීක්ෂණ, අභයන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුලුව සම්බන්ධිත පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

**2.1** නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2015 ජූලි 14 දිනැති අංක 03/ 2015 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය සහ මුදල් රෙගුලාසි 371 (2) (ආ) | ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂා කරන ලද නියමිත දිනට දින 14 සිට මාස 09 දක්වා කාලසීමාවට පෙර අවස්ථා 20 කදී රුපියල් මිලියන 2.9 ක අග්‍රිම ලබාදී තිබුණි. තවද, | කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමේ හා අග්‍රිම නිරවුල් කිරීමේ ප්‍රමාදයක් ඇති වී තිබුණි. | අග්‍රිම මත මූල්‍ය පාලනය ශක්තිමත් කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සමාලෝචිත වර්ෂය තුල වැඩසටහන් 15 ක් පැවැත්වීම සඳහා ලබාදුන් රු. මිලියන 1.61 ක උප අග්‍රිම මුදල් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | | |
| (ආ) | මුදල් රෙගුලාසි අංක 371 (5) | 2018 සහ 2019 වසර තුල අවස්ථා 28 කදී ගෙවා ඇති රු.මිලියන 1.44 ක උප අග්‍රිම වර්ෂය තුල පියවා නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් නිරවුල් කිරීමේ වවුචර ලැබීමේ ප්‍රමාදයක් විය. | අග්‍රිම මත මූල්‍ය පාලනය ශක්තිමත් කල යුතුය. |
| | | අවස්ථා 211 කදී ගෙවා ඇති රු.මිලියන 10.59 ක උප අග්‍රිම මාස 01 සිට මාස 11 දක්වා ප්‍රමාද වීමෙන් පසු පියවා තිබුණි. | රට තුල පනවා තිබූ ඇඳිරි නීතිය හේතුවෙන් කාර්යාල සම්පූර්ණයෙන් පවත්වාගෙන යාමට නොහැකි වූ අතර තැපැල් සේවයේ ප්‍රමාදයද මෙම ප්‍රමාදයට හේතු විය. | අග්‍රිම මත මූල්‍ය පාලනය ශක්තිමත් කල යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**
-----------------------

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**
------------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල පලාත් සම්පත් මධ්‍යස්ථාන 09 ක් වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 37.95 ක් වෙන්කර තිබුණි. එහෙත් රු. මිලියන 1.94 ක් වැයකර එක් සම්පත් මධ්‍යස්ථානයක් පමණක් වැඩි දියුණු කර තිබුණි. | පළාත් සම්පත් මධ්‍යස්ථාන 03 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර, මධ්‍යස්ථාන 02 ක එකඟ වූ වැඩ අවසන් කර ඇත. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ ව්‍යාපෘති කාල සීමාව තුල පාර්ශවකරුවන්ට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ඉලක්කවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2016 වසරේ සිට 2021 ජුනි 30 දක්වා ව්‍යාපෘති කාලසීමාව තුල වෙන්කර ඇති රු.මිලියන 351 ක මුදලින් සේවා නොලබන සහ අඩු පහසුකම් සහිත ප්‍රදේශවල නව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 45 ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මධ්‍යස්ථාන කිසිවක් සම්පූර්ණ කර නොතිබුණි. | 2020 පෙබරවාරි මාසයේදී මධ්‍යස්ථාන 11 ක ඉදිකිරීම් ආරම්භ කරන ලද අතර කෝවිඩ් 19 හේතුවෙන් එම කටයුතු සිදු කිරීමේ ප්‍රමාදයක් ඇතිවිය. ඉතිරි මධ්‍යස්ථාන 34 හි වැඩ ආරම්භ කිරීමට මූලික කටයුතු අවසන් කර ඇත. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ ව්‍යාපෘති කාල සීමාව තුල පාර්ශවකරුවන්ට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ඉලක්කවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 6,477 ක පහසුකම් වැඩිදියුණු කිරීමේ ප්‍රදානයක් ලබාදීම සඳහා 2017 වසරේ සිට 2020 දක්වා | 2021 අප්‍රේල් 30 වන විට මධ්‍යස්ථාන 4,007 ක වැඩිදියුණු කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇත. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ ව්‍යාපෘති කාල සීමාව තුල පාර්ශවකරුවන්ට අපේක්ෂිත |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 2,747 ක් වෙන් කර තිබුණි.<br>කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මධ්‍යස්ථාන 4,634 ක් සඳහා රු.මිලියන 1,588 පමණක් මුදාහැර තිබුණි.<br>එම වැඩිදියුණු කිරීම් අතුරින් මධ්‍යස්ථාන 1,312 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි. | | ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ඉලක්කවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

**3.2** **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

-----------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| | -------------------------- | -------------------------- | -------------------------- |
| (අ) | ජාත්‍යන්තර සංවර්ධන සංගමය මඟින් උෂ්ණත්වමාන 1,400 ක් මිලදීගැනීම සඳහා අනුමැතිය ලබාදී තිබුණද, මැයි මාසය තුල රු.මිලියන 73.8 ක් වැයකර උෂ්ණත්වමාන 4,500 ක් හදිසි අවශ්‍යතා මත සෘජු ප්‍රසම්පාදන ක්‍රමය යටතේ මිලදීගෙන තිබුණි. තවද, දෙසැම්බර් මාසය තුල එම සැපයුම්කරුවන්ගෙන්ම ඒකකයක් රු. 6,250 කට තවත් උෂ්ණත්වමාන මිලදීගෙන තිබුණි. එබැවින් පෙර පාසල් වසා දමා ඇති පසුබිමක මැයි මාසය තුල ඒකකයක් රු. 16,400 කට හදිසි අවශ්‍යතා පදනම මත මිලදී ගැනීම හේතුවෙන් මිලියන 45.67 ක පාඩුවක් සිදු වී තිබුණි. | රටේ සාමාන්‍ය තත්ත්වය හේතුවෙන් 2020 දෙසැම්බර් මාසයේදී මිල අඩු වී තිබූ අතර, තරඟකාරී ලංසු තැබීම් මත ප්‍රසම්පාදනය සිදු කර ඇත. | ප්‍රසම්පාදනයෙන් අලාභ නොවන පරිදි ආර්ථිකව කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කල යුතුය. |
| (ආ) | සෘජු ප්‍රසම්පාදන ක්‍රමය යටතේ රු.මිලියන 109.91 ක් වැයකර සේදුම් බේසම් 4,500 ක් සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගෙන තිබුණි. කෙසේ වෙතත්, ගිවිසුම්ගත වූ දින සිට දින 14 සිට දින 27 දක්වා කාලයක් භාණ්ඩ සැපයීමේ ප්‍රමාදයන් සිදු වී තිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | ගිවිසුම එහි සඳහන් නියමයන් හා කොන්දේසි අනුව ක්‍රියාත්මක කල යුතුය. |
| (ඇ) | නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් 2017 වසරේ ආරම්භ කරන ලද අතර 2019 | දන්ඩන මුදල් සහ සංචලන අත්තිකාරම් ආපසු අයකර ගැනීමට ක්‍රියාකරමින් සිටින අතර, වැරදීමකින් | ඉදිකිරීම් ඵලදායී ලෙස සිදු කිරීමට කටයුතු කල යුතුය. |

වර්ෂයේදී ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. මේ සම්බන්ධයෙන් රු.මිලියන 0.48 සහ රු.මිලියන 0.77 ක දන්ඩන සහ සංචලන අත්තිකාරම් පිළිවෙලින් අයකරගෙන නොතිබුණි. තවද, කාර්යසාධන බැඳුම්කර සහ අත්තිකාරම් බැඳුම්කර කල් ඉකුත් වී තිබූ අතර ව්‍යාපෘතියේ දුර්වල අධීක්ෂණය නිරීක්ෂණය විය.

කාර්යසාධන බැඳුම්කරය දීර්ඝ කිරීමට නොහැකි වී තිබූ අතර විධිමත් ආකාරයෙන් වැඩබිම අධීක්ෂණය කිරීමට කටයුතු කරමින් ඇත.